# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2021-02-18

පැමිණිලි පාර්ශවය : ඩබ්ලිව්.එස්. බණ්ඩාර මහතා.
බණ්ඩාරවත්ත.
වැල්ලැව. පල්ලෙබැද්ද.

ඩබ්ලිව්. තරිදු මධුශංක මහතා - (අගතියට පත් පාර්ශවය)

වගඋත්තර පාර්ශවය :

01. උ.පො.ප. ප්‍රේමසිරි ලියනගම මහතා.
පොලිස් ස්ථානය.
ඇඹිලිපිටිය.

02. පො.කො. 79111 සම්පත් මහතා.
පොලිස් ස්ථානය.
ඇඹිලිපිටිය.

03. පො.කො. අජිත් මහතා.
පොලිස් ස්ථානය.
ඇඹිලිපිටිය.

04. පො.කො. 13054 ජී.ඒ.බී.ඩී. බණ්ඩාර මහතා.
පොලිස් ස්ථානය.
ඇඹිලිපිටිය.

<u>පැමිණිලි අංකය : **HRC/284/15**</u>

පැමිණිල්ල : -

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම සහෝදරයා වන අගතියට පත් ඩබ්ලිව්. තරිදු මධුශංක යන අයව 2015.01.20 වන දින නිවසේ සිටියදී ප.ව. 2.00 ට පමණ ඇඹිලිපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් පිරිසක් විසින් කටඋත්තරයක් ලබාගැනීමට යැයි පවසා රැගෙන ගිය බවත්, තමාද තමාගේ අනෙක් සහෝදරයා සමග පොලිස් ස්ථානයට



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ගිය බවත්, එවිට මල්ලීගේ අත්දෙකට මාංචු දමා මල්ලී පොලිස් ස්ථානයට රැගෙන ආ බවත්, පොලිස් කූඩුවේ දී මල්ලීව දුටු බවත්, ඔහුට අමානුෂික අන්දමින් පහර දී තිබූ බවට තමා දුටු බවත් ප්‍රකාශ කර ඇත.

අගතියට පත් වීරතුංගගේ තරිඳු මධුශංක යන අය දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2015.01.20 වන දින ඇඹිලිපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් 05 දෙනෙකු පමණ පැමිණ තමාව පොලිස් ජීප් රථයේ දමාගෙන රැගෙන ගිය බවත්, එසේ රැගෙන ගියේ තමාගෙන් කටඋත්තරයක් ලබාගැනීමට බව පැවසූ බවත්, පොලිස් ස්ථානයට යන අතරතුරදී තමාට අමානුෂික අන්දමින් පහරදුන් බවත්ය. එසේම මෙම පහරදීම නිසා තමා බරපතල ලෙස රෝගාතුර වූ බවත්, අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේදී ඒ බව අධිකරණයට ප්‍රකාශ කළ බවත්, අධිකරණ නියෝගයක් මත 2015.01.22 වන දින රත්නපුර රෝහලට ඇතුළත් කළ බවත්, 2015.01.25 වන දින දක්වා ප්‍රතිකාර ලබාගත් බවත් කොමිෂන් සභාව ඉදිරියේදී ප්‍රකාශ කර ඇත. රෝගී තත්ත්වය නිසා තමා නැවතත් 2015.01.27 වන දින රෝහලට ඇතුළත් වී 2015.01.29 වන දින දක්වා ප්‍රතිකාර ලබාගත් බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

පහරදීම සනාථ කිරීම සඳහා රත්නපුර අධිකරණ වෛද්‍යවරයාගෙන් වෛද්‍ය වාර්තා කැඳවා ඇති අතර, එම වෛද්‍ය වාර්තාවේ රෝගියාගේ කෙටි ඉතිහාසයේදී දක්වා ඇත්තේ "2015.01.20 වන දින සවස 2.00 ට පමණ ඇඹිලිපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් අත්අඩංගුවට ගෙන පල්ලෙබැද්දේ ගෙදර සිට ඇඹිලිපිටිය පොලිසියට රැගෙන යන අතරතුරදී අතින් පයින් සහ පොලු වලින් පහරදුන් බවත්, ඇස් වලට මිරිස් කුඩු දැමූ බවත්ය." අධිකරණ වෛද්‍ය වාර්තාවේ බරපතල නොවන තුවාල එකක් ඇති බවට සඳහන් කර ඇත.

තවද, අගතියට පත් අයව ඇඹිලිපිටිය රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත ද ඉදිරිපත් කර ඇති අතර, එම අධිකරණ වෛද්‍ය වාර්තාව අනුවද බරපතල නොවන තුවාල එකක් ඇති බවට සඳහන් කර ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

පැමිණිල්ලට අදාළව වගඋත්තර පාර්ශවය වෙතින් වාර්තාවක් කැඳවා ඇති අතර, වගඋත්තරකරුවන් විසින් තොරතුරු සටහන් පොත් වල උද්ධෘත සහිත වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලබාදී ඇත.

පළවන වගඋත්තරකාර උ.පො.ප. ලියනගේ යන අය මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, වීරතුංගගේ තරිඳු මධුශංක යන අය බස් හිමියෙකුගේ සේවකයෙකු වශයෙන් සිටියදී බැටරි තුනක් සොරකම් කිරීම සම්බන්ධයෙන් එම බස් රථයේ හිමිකරු වන ගම්ආරච්චිලාගේ අතුල චන්ද්‍රසිරි නැමති අය විසින් 2015.01.20 වන දින පැය 11.45 ට පැමිණිල්ලක් කළ බවත්, එම පැමිණිල්ලේ තරිඳු මධුශංක යන අය මෙම සිද්ධියට සැක කරන බවත්, CCTV කැමරා වල අදාළ බැටරි තුන රැගෙන යන බවට ප්‍රදර්ශනය වන බවත්, එම දර්ශන පරීක්ෂා කිරීමෙන් අනතුරුව සැක පිට 2015.01.21 වන දින අත්අඩංගුවට ගත් බවත්, එම CCTV දර්ශන මගින් මෙම සැකකරුගේ පාවහන් යුවළද හඳුනාගෙන ඇති බවත්, අදාළ දර්ශන පටි මොරටුව විශ්ව විද්‍යාලය වෙත යොමු කර ඇති බවත්, අත්අඩංගුවට ගත් සැකකරුට කිසිදු පහරදීමක් නොකළ බවත් සඳහන් කර ඇත.

මෙම සැකකරු අත්අඩංගුවට ගැනීමට යාමේදී ඔහුගේ නිවසේ ඉදිරිපස දොර වසා තිබූ අතර. දොරට තට්ටු කර කථා කරන විට ඔහු පිටුපස දොර ඇර දිවූ බවත්. එම ස්ථානයේ බොරළු සහිත බිමක් තිබූ නිසා අඩි 20 ක් පමණ තැනකින් පහළට ගලක් උඩට වැටුන් බවත් ප්‍රකාශ කර ඇත. ඔහුගේ පිටුපස පෙදෙසේ තැලීමක් පමණක් තිබූ අතර. එය වැටීමෙන් සිදුවූ බවද ප්‍රකාශ කර ඇත. එම අයව අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර ඇඹිලිපිටිය රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ බවද ඔහුට විරුද්ධව ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ බී අංක : 103/15 යටතේ නඩුවක් විභාග වන බව ද සඳහන් කරන අතර. මෙම වැටලීම සඳහා තමා සමග තවත් නිලධාරීන් දෙදෙනෙක් සහභාගී වූ බව ද සඳහන් කර ඇත.

දෙවන වගඋත්තරකරු ලෙස නම් කර ඇති පො.කො. 79111 සම්පත් යන අය ප්‍රකාශ කර ඇත්තේ. තමා ඇඹිලිපිටිය පොලිස් ස්ථානයේ සේවය කරමින් සිටියදී පොලිස් රියදුරෙක් නොමැති අවස්ථා වලදී තමා පොලිස් රියදුරු ලෙස කටයුතු කළ බවත්. ඒ සඳහා තමාට පොලිස්පතිවරයාගෙන් අවසර ලැබී ඇති බවත්. මෙම පැමිණිල්ලේ සඳහන් අයව අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් නිලධාරීන් රැගෙන ගිය ජීප් රථය තමා විසින් පැදවූ බවත්. තමා දැනට කුට්ටිගල පොලිස් ස්ථානයේ සේවය කරන බැවින් සටහන් පොත් පත් නොමැති නිසා දින හා වේලාවන් නිසි ලෙස ප්‍රකාශ කිරීමට නොහැකි බව ද ප්‍රකාශ කර ඇත. එසේම තමා කිසිදු පහරදීමක් නොකළ බවද රථය පදවාගෙන යන රාජකාරිය පමණක් සිදුකළ බවද ප්‍රකාශ කර ඇත.

තුන්වන වගඋත්තරකරු ලෙස නම් කර ඇති පො.කො. 47123 අජිත් යන අය ප්‍රකාශ කර ඇත්තේ. තමා වැටලීමට සහභාගි නොවූ බවත්. පහරදීමක් සම්බන්ධයෙන් කරන චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්ය.

හතරවන වගඋත්තරකරු ලෙස නම් කර ඇති පො.කො. 13054 පී.ජී.බී.ඩී. බණ්ඩාර යන අය ප්‍රකාශ කර ඇත්තේ. තමා ඇඹිලිපිටිය පොලිස් ස්ථානයේ සේවය කළ බවත්. තමා පොලිස් ස්ථානයේ පාලන අංශයේ රාජකාරි කටයුතු කළ බවත්. මෙම අත්අඩංගුවට ගැනීමට තමා සම්බන්ධ නොවූ බවත්. තමා විසින් මෙම අයට කිසිදු පහරදීමක් හෝ මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණ කටයුත්තකට සම්බන්ධ නොවූ බවත් ය.

**නිරීක්ෂණ :-**

අගතියට පත් වීරතුංගගේ තරිඳු මධුශංක යන අය අත්අඩංගුවට ගැනීමෙන් පසු අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර 2015.01.22 වන දින ඇඹිලිපිටිය රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කර ඇති බවත්, ඉන්පසුව අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේදී අගතියට පත් පාර්ශවය විසින් අධිකරණයට පහරදීම සම්බන්ධයෙන් ප්‍රකාශ කිරීමෙන් අනතුරුව රත්නපුර රෝහලේ පොලිස් මුරපොල විසින් නිකුත් කරන ලද 185/15 අධිකරණ වෛද්‍ය පෝරමය යටතේ අධිකරණ වෛද්‍ය නිලධාරි වෙත ද යොමු කොට ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව අධිකරණ වෛද්‍ය වාර්තාවන්හි තුවාල දෙකක් වෙනත් වෙනත් ස්ථානවල දක්වා ඇත.

1. 6cm×5cm තැල්මක් දකුණු විලුඹේ ඉදිරියේ සහ
2. 5cm×5cm පිටුපස පෙදෙසේ තැල්මක්

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම අනුව ඩබ්ලිව්. තරිඳු මධුශංක යන අයව අත්අඩංගුවට ගෙන ඇත්තේ 2015.01.21 වන දිනය. එසේම 2015.01.21 දින 200/49 යටතේ යොදා ඇති සටහනට අනුව පො.කො 46123 අජිත් එම වැටලීමට ගිය බව දක්වා තිබුනද එම නිලධාරී එවැනි වැටලීමකට සහභාගී නොවූ බවට දක්වා ඇත. ඒ අනුව 2015.01.21 සටහන සාවද්‍ය තොරතුරු ඇතුලත් සටහනක්ද යන්න ප්‍රශ්නගත වේ.

වගඋත්තරකරුවන්ගේ තොරතුරු සටහන් පොත් වලට අනුව 2015.01.20 වන දින පැය 12.15 ට වගඋත්තරකරුවන් විසින් මෙම අගතියට පත් අයට විරුද්ධව ඇති පැමිණිල්ලක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා උ.පො.ප. රත්නසිරි. පො.සැ. 4260 සුමනසේන. පො.කො. 79111 සම්පත් විසින් පදවනු ලැබූ ජීප් රථයෙන් පිටව ගිය බවට සටහන් යොදා ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් ප්‍රකාශ කර ඇත්තේ, තම සොහොයුරාව 2015.01.20 වන දින පැය 2.00 ට අත්අඩංගුවට ගත් බවයි. මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් විසින් උද්ඝෝෂනයක් පවත්වන ලද බවයි. ඊට අදාලව පුවත්පත් වාර්තාවක පිටපතක්ද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

පැමිණිල්ල සම්බන්ධයෙන් 2015.04.30 දින පවත්වනු ලැබූ පරීක්ෂණයේදී පැමිණිලිකරු කොමිෂන් සභාව ඉදිරියේදී ප්‍රකාශ කර ඇත්තේ, වගඋත්තරකරුවන් නම් කිරීමේදී තමා අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී එම අයව මින් පෙර නොහඳුනන නිසා තමාට ලැබුණු තොරතුරු මත අත්අඩංගුවට ගන්නා ලද බවත්, ඒ අනුව පො.සැ. 42601 සුමනසේන සහ පො.කො. 13054 බණ්ඩාර යන අය ඔහුව අත්අඩංගුවට ගැනීම සඳහා හෝ ඔහුට පහරදීම සඳහා පැමිණි නිලධාරීන් නොවන බවට සඳහන් කර ඇත.

වගඋත්තරකරුවන් විසින් සැකකරුව අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර ඇඹිලිපිටිය රෝහලට ඉදිරිපත් කර ඇති අතර, එහිදී ද පැමිණිලිකරු වෛද්‍යවරයා වෙත පවසා ඇත්තේ තමාව 20 වන දින අත්අඩංගුවට ගත් බවයි. ඒ අනුව අගතියට පත් තරිඳු මධුශංක යන අයව 2015.01.20 වන දින අත්අඩංගුවට ගත් බවට නිරීක්ෂණය වේ. ඒ අනුව වින්දිත පැය 24 කට අධික කාලයක් රඳවා තබා ගැනීම තුලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව මෙහිදී අවධාරණය වේ.

තොරතුරු සටහන් පොත් වලට අනුව 2015.01.22 වන දින පැය 17.05 ට පිටුව 108 ඡේදය 110 හි MOIB තොරතුරු සටහන් පොතේ සටහන් කර ඇත්තේ සැකකරුවකු වන ඩබ්ලිව්. තරිඳු මධුශංක යන අයව බී අංක : 103/15 යටතේ අධිකරණයට ඉදිරිපත් කළ බවත්, ශරීර ඇප දෙකක් රු. ලක්ෂය බැගින් ඇප

වශයෙන් නියම කර ඇති බවත්, 2015.03.04 වන දින වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට නියෝග කළ බවත්, සැකකරුගේ නීතිඥ මහතා 2015.01.20 වන දින අත්අඩංගුවට ගෙන 2015.01.22 දින දක්වා රඳවා තබාගෙන ඇති බවටත්, සැකකරුට අමානුෂික ලෙස පහරදීම් කර ඇති බවටත් කරුණු දක්වා ඇති බවත්ය. ඒ අනුව පැමිණිල්ලක් කිරීමට අවවාද කරන ලෙසට ගරු මහේස්ත්‍රාත්තුමිය විසින් සටහන් කර ඇත. මේ අනුවද පැමිණිලිකරුව 2015.01.20 දින අත්අඩංගුවට ගෙන ඇති බවත්, පහරදීමක් සිදුකර ඇති බවත් වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

නිගමනය :-

පැමිණිලිකරුට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තා අනුව සහ ඉදිරිපත් වී ඇති කරුණු අනුව ඩබ්ලිව්. තරිඳු මධුශංක යන අයට වගඋත්තරකරුවන් විසින් පහරදීමක් සිදුකර ඇති බවට තහවුරු වන අතර, එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

එසේම, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 24 වන වගන්තිය අනුව යම් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන එන කාලය සහ නැවත පොලිස් ස්ථානයේ සිට අධිකරණයට ඉදිරිපත් කරන කාලය අතර පැය 24 කට වඩා රඳවා තබා ගත නොහැකි බවට දක්වා ඇත. පැමිණිල්ලේ ඉදිරිපත් වී ඇති කරුණු වලට අනුව සැකකරුව අත්අඩංගුවට ගෙන ඇත්තේ 2015.01.20 වන දින පැය 2.00 ට වන බවත්, අධිකරණයට ඉදිරිපත් කර ඇත්තේ 2015.01.22 වන දින වන බවත් පාර්ශවයන් වෙතින් ඉදිරිපත් වී ඇති කරුණු අනුව තහවුරු වී ඇත. ඒ අනුව මෙම අගතියට පත් ඩබ්ලිව්. තරිඳු මධුශංක යන අයව නීතියෙන් නියම කර ඇති ආකාරයෙන් තොරව රඳවා තබාගෙන ඇති බැවින් එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර ඇති මූලික අයිතිවාසිකමද උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, කොමිෂන් සභා පරීක්ෂණයේදී අගතියට පත් අය ප්‍රකාශ කර ඇත්තේ, තුන්වන සහ හතරවන වගඋත්තරකරුවන් තමා අත්අඩංගුවට ගැනීමට හෝ පහරදීමට සහභාගී නොවූ බවත්, ඔවුන්ව වගඋත්තරකාරභාවයෙන් ඉවත් කිරීම සඳහා තමාට විරුද්ධත්වයක් නොමැති බවත්ය. එම නිසා මෙම පැමිණිල්ලට අදාළව තුන්වන සහ හතරවන වගඋත්තරකරුවන් මූලික අයිතිවාසිකම් කඩ කිරීම සම්බන්ධයෙන් වන වගකීමෙන් නිදහස් කරනු ලැබේ.

නිර්දේශය =:

01. ඒ අනුව පළවන හා දෙවන වගඋත්තරකරුවන් විසින් අගතියට පත් තැනැත්තා වන ඩබ්ලිව්. තරිඳු මධුශංක යන අයට රු. 20,000/- ක මුදලක් ගෙවිය යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. එසේම පළවන හා දෙවන වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත සහ පොලිස් කොමිෂන් සභාව වෙත යොමු කරන බවද දන්වා සිටිමු.

2021.03.18 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසුයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 1. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

2. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07

සැ.යු - අදාළ මුදල් "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැළැස්විය යුතුය.

B/